**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ)**
**எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்**
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition – Parliament of Sri Lanka

2023.06.24

## විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා විසින් නිකුත් කළ විශේෂ නිවේදනය!

මෙරට සියයට දාහතරක්ව පැවති දුප්පත්කම මේ වන විටත් 31% දක්වා ඉහළ ගොස් ඇති අතර රටේ සමස්ත දුප්පත්කම ලක්ෂ 70 ඉක්මවා තිබේ.

රෝහල්වලට අවශ්‍ය ඖෂධ හිඟවීම හේතුවෙන් මේ වන විට ශ්‍රී ලංකාව ඉතාම දරුණු සෞඛ්‍යමය ඛේදවාචකයක් කරා ඇදී යමින් සිටී.

ඖෂධ හිඟය, ඖෂධ මිල අධික ලෙස ඉහළ යෑම ඖෂධ හරහා කළ වංචා දූෂණ යනාදී සියල්ල එකට ගත් විට සමස්ත ආණ්ඩුව මේ රටේ රෝගී ජනතාවගේ ජීවිත සමඟ පවා සෙල්ලම් කරමින් සිටි.

ආණ්ඩුව පළමුකොට කළ යුතුව තිබුණේ රටේ පවත්නා සත්‍ය තත්වය අවබෝධ කර ගැනීම උදෙසා රටේ පවත්නා සත්‍ය තත්වය විනිවිද දැකිය හැකි සමීක්ෂණයක් සිදු කිරීමය. ඒ වෙනුවට ආණ්ඩුව උගුරට හොරා බෙහෙත් බොන්නට ගොස් මුළු රටටම අවදානමක් කරා තල්ලු කොට තිබේ.

දුප්පත් ජනතාවට සහන සැලසීම පිණිසයැයි කියමින් ආණ්ඩුව අස්වැසුම යන ඇස්බැන්දුමක් හඳුන්වා දී ඇති අතර වසර තුනක් පුරා එම වැඩසටහන හරහා සහන සැලසෙන්නේ ලක්ෂ 12 ක ආසන්න පිරිසකට ය. රටේ දුප්පත් ජනතාව ලක්ෂ 70ක් සිටියදී ලක්ෂ 12කට සහන සැලසීමේ අරමුණ කුමක්දැයි අපි ආණ්ඩුවෙන් ප්‍රශ්න කරන අතර,ඒ ලක්ෂ 12 ද තෝරා ගත්තේ කුමන සමීක්ෂණයක් සහ කුමන දත්ත මත පදනම්ව දැයි අපි ආණ්ඩුවෙන් ප්‍රශ්න කර සිටිමු.

හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් අන්තනෝමතික ලෙස පොහොර තහනම් කොට මුළු රටම සාගතයක් වෙත තල්ලු කළ අතර,ඔහුගේ අනුප්‍රාප්තික ජනාධිපති රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ ආණ්ඩුවද මුලු රටම අන්දවමින් සමස්ත රටේ ජනතාව මරණ මංචකය වෙත රැගෙන යමින් සිටී.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආණ්ඩුව රටට සිදු කරන්නට යන බරපතළ ඛේදවාචකය පිලිබඳව කල්තියාම සමගි ජන බලවේගයේ අපි විසින් රටට අනතුරු ඇඟ වූ අතර වර්තමාන ආණ්ඩුවේ ක්‍රියාකලාපය ඊට නොදෙවෙනි මට්ටමක පවතින බවට ද මුල සිටම අනතුරු ඇඟවීමු.

කෙසේ වෙතත්,රටත් රටේ ජනතාවත් අනතුරට හෙළීමේ ඒකායන ප්‍රාර්ථනාව ආණ්ඩුව තුළ ඇති අතර එසේ නොවන්නේ නම් මෙතරම් පීඩනයක් ජනතාව වෙත එල්ල කරන්නට ආණ්ඩුව කිසිසේත් කටයුතු කරන්නේ නැත.

මේ මොහොතේ රටට තීරණාත්මක ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කෙරෙන ගනුදෙනුව පවා පොදු අරමුණකින් එකට එක්ව රට ගැන සිතා කරනු ලබන්නක් නොව,හුදෙක් සිය පටු අරමුණු මුදුන්පත් කර ගනු පිණිස කරනු ලබන්නක් බවට ආණ්ඩුව පත් කොට තිබේ.
මේ සියල්ල තුළින් ගම්‍ය වන්නේ අවස්ථාවාදී ආණ්ඩුවේ අදූරදර්ශී අන්තනෝමතික ක්‍රියාවලිය මිස අන් කිසිවක් නොවේ.

මේ තත්ත්වය වෙනස් කොට ජනතාවාදී චින්තනයක් තුළින් රට ගොඩනැඟිය හැක්කේ නව ජනවරමක් හරහා බව නැවත නැවතත් අවධාරණය කරන අතර ඒ වෙනුවෙන් ආණ්ඩුවට කළ හැකි සියලු බලපෑම් කරන බව ද අවධාරණය කරමු.

රටෙහි පවත්නා තත්වය අවබෝධ කොටගෙන ලර්න් ඒෂියා ආයතනයේ විසින් සිදුකරන ලද සමීක්ෂණය ප්‍රකාරව රටේ ලක්ෂ 70ක දුප්පත් ජනගහනය ඉලක්ක කර ගනිමින් අස්වැසුම ක්‍රියාත්මක කළයුතු අතර මෙතෙක් හුදු පටු අරමුණු ඉලක්ක කරගනිමින් අවිද්‍යාත්මකව තෝරා ගෙන ඇති පිරිස වෙනුවට විද්‍යාත්මක වැඩපිළිවෙළක් හරහා සැබෑ අවශ්‍යතාවයන් ඇති පිරිස තෝරා ගත යුතු බවත්,රටෙහි පවත්නා බරපතළ ඖෂධ හිඟයට පිළියම් කඩිනමින් යෙදිය යුතු බවත් ඊට අවශ්‍ය කරන සහයෝගය සමගි ජන බලවේගය ලබාදෙන බවත් සිහිපත් කරමු.

සජිත් ප්‍රේමදාස
විපක්ෂ නායක

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
இலக்கம் 30, சேர் மாக்கஸ் பெர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
No. 30, Sir Marcus Fernando Mawatha, Colombo 07.

දුරකතන / தொலைபேசி / Telephones: 011 2699171, 011 2699204
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2699174
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E – mail: sajith_p@dialogsl.net, oppositionleader.sp@gmail.com